සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

10 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2023(2024) | 44 S I

නම: ..............................................................

# නර්තනය

කාලය - පැය එකයි

I සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

II අංක 1 සිට 40 තෙක් ප්‍රශ්න වලට දී ඇති (1),(2),(3),(4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.

III ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට ගැළපෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

1. ජීවන වෘත්තීන් හා බැඳි නර්තන නිර්මාණ කීපයකි.
   I පතල්, කෘෂි, ඔන්චිලි, සවරම්    III ධීවර, මැටි, කෘෂි, තේ
   II ධීවර, තේ, ප්‍රශස්ති, වන්නම්    Iv පතල්, චාමර, කොහු. තේ

2. ගායනය, වාදනය හා නර්තනය එකවර දැකිය හැකි ගැමි නැටුමක් වන්නේ,
   I චාමර    II රබන්    III කළ    IV කුළු

3. රස හා භාව පිළිබඳ තොරතුරු ඇතුළත් "නාට්‍ය ශාස්ත්‍රය" නම් කෘතිය රචනා කරන ලද්දේ ............ විසිනි.
   I භරත මුනිවරයා    II නන්දිකේෂ්වර පඬිවරයා    II රවීන්ද්‍රනාත්තාගෝර් තුමා    IV රාම්ගෝපාල්

4. 10,11,12 යන ගොඩ සරඹයන්හි සරඹ නාම පිළිවෙළින්,
   I බඹර සරඹය, අංගහාර සරඹය, අර්ධචක්‍ර සරඹය    III. දැත පැගීමේ සරඹය, බඹර සරඹය, පැනීම් සරඹය
   II පැනීම් සරඹය, බඹර සරඹය, දැත පැගීමේ සරඹය    Iv. බඹර සරඹය, පැනීම් සරඹය, චන්ද්‍රිකා සරඹය

5. උඩරට ගොඩ සරඹවල කස්තිරම් අතුරින් ප්‍රථමයෙන් සුරල් පෑගීම ආරම්භ කරනු ලබන සරඹය වනුයේ,
   I 10 වන සරඹය    II 11 වන සරඹය    III 12 වන සරඹය    IV 9 වන සරඹය

6. සාම්ප්‍රදායික චලන ඇසුරින් අලංකාර මාත්‍රා නිර්මාණය කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණක් නොවන්නේ,
   I ප්‍රකාශනාත්මක චලන යොදා ගැනීම.    III කැරකීම්, පැනීම්, සුරල් ආදිය යොදා ගැනීම.
   II තාල රූපය ඉස්මතු වන සේ මාත්‍රා යොදා ගැනීම.    IV දිසා හා තල නිසි ලෙස යොදා ගැනීම.

7. තාම් දොම්තිගත ............... කඩතක තරිකිට ........................
   දොම්තිගත කිත්තක් ............... තාකු ජිත්ත ගත දොම්කිට
   තරිකිට කුන්දත් තා
   මෙහි හිස්තැන් වලට සුදුසු පද වන්නේ,
   I කුදකුද, කිතක, දොම්කිට    II දොම්කිට, තරිකිට, කුදකුද
   III දොම්කිට, කිතක, කුදකුද    IV තරිකිට, කිත්තක්, කුදකුද

8. "දොං දොං ජිං ජිං ගජිගත" යන බෙර පදය වාදනයට අනුව ගායනය කළ හැකි කවි පදය වන්නේ,
   I සුරිඳුන් පෙර සිටන් ....    II සත් වෙත් මහත් අදර ...
   III පෙරත් කලෙක සිහ රජෙක් ....    IV අඟය වඩන කවි වරුණ ...

9. තාත් ජිං තත් තත් ..... යන අඩව්ව නටනු ලබන්නේ,
   I මාත්‍රා 2+4 තාලයටය.    II මාත්‍රා 2+3 තාලයටය.    III මාත්‍රා 3+4 තාලයටය.    IV මාත්‍රා 2+2+4 තාලයටය.

10. ආංගික අභිනයේ දී ප්‍රත්‍යාංග කොටසට පමණක් අයත් වනුයේ,
   I මැණික් කටුව, හිස, දෙපා    II බෙල්ල, හිස, කඳ
   III බෙල්ල, මැණික් කටුව, උරබාහු    IV හිස, කඳ, දෑත්

11. ආදරය, දුක, පිළිකුල වැනි මිනිස් හැඟීම් ..................... අභිනයෙන් නිරූපණය කෙරේ.
   I ආංගිකම්    II සාත්ත්වික    III වාචික    IV ආහාර්යය

12. බෙර වාදනයේ දී ස්වරාක්ෂර වලට .................. යැයිද උපකාරාක්ෂර වලට .............. යැයි ද කියනු ලැබේ.
   I ගර්භාක්ෂර, ප්‍රාණාක්ෂර    II බීජාක්ෂර, ගර්භාක්ෂර
   III බීජාක්ෂර, ද්විත්වාක්ෂර    IV ගර්භාක්ෂර, ව්‍යංජනාක්ෂර

13. උඩරට, සබරගමු, පහතරට වන්නම් රචනා කරන ලද ස්ථාන ඇතුලත් වරනය පිළිවෙලින්,
I සමන් දේවාලය, දෙවුන්දර දේවාලය, උපුල්වන් දේවාලය III කවිකාර මඩුව, දෙවුන්දර දේවාලය, සමන් දේවාලය
II කවිකාර මඩුව, සමන් දේවාලය, උපුල්වන් දේවාලය IV සමන් දේවාලය, කතරගම දේවාලය, කවිකාර මඩුව

14. ආඝාතාත්මක, අනාඝාතාත්මක යන ලක්ෂණ දෙකම එකවර යෙදෙන ගායන විශේෂය,
I පතල් II බඹර III ටීකා IV පාරු

15. රවුම් ලීයක අග එක් පසෙකට හණ හා නියඟ වල සුසිනිඳු කෙඳි යොදා සකස් කර ගන්නා රංග උපකරණයකි.
I චාමර II සවරම් III සේසත IV වේවැල්

16. නමස්කාර ගාථාවල දැකිය හැකි ලක්ෂණ වනුයේ,
I සංයමය, වීරත්වය, ගෞරවය
II ගෞරවය, භක්තිය, හාස්‍ය
III විශ්මය, භක්තිය, ගෞරවය
IV භක්තිය, ගෞරවය, සංයමය

17. "අටදෙන අට කොණ වාඩිවෙයල්ලා... " මෙම කවියේ දෙවන කවි පදය වන්නේ,
I පුරවර මැද බැඳි රන් ඔන්චිල්ලා
II සිටගෙන දෙදෙනෙක් පොලු පාගල්ලා
III අපිත් පදිමු මේ රන් ඔන්චිල්ලා
IV වැරසැර පිරිමින් තව පැදපල්ලා

18. දුටුගැමුනු රජු මහාසෑය බැඳීම සඳහා වඩුවන් රැස් කිරීමට අණ බෙර වැයූ බව සඳහන් වන වංශකතාව වන්නේ,
I ථූප වංශය II දීප වංශය III මහා වංශය IV චූල වංශය

• 19 - 21 දක්වා ප්‍රශ්න වලට පහත වගුව ඇසුරෙන් පිළිතුරු සපයන්න.

| පේළිය | A තීරුව | B තීරුව | C තීරුව | D තීරුව |
|---|---|---|---|---|
| 1 | දුටුගැමුණු රජු | ස්පිල් බර්ජන් | සරස්වතී මණ්ඩපය | රොබට් නොක්ස් |
| 2 | පරාක්‍රමබාහු රජු | නිශ්ශංකලතා මණ්ඩපය | අනුරාධපුර යුගය | පොළොන්නරු යුගය |
| 3 | මහනුවර යුගය | මහා වංශය | කවිකාර මඩුව | ථූප වංශය |
| 4 | ගම්පොළ යුගය | විමලධර්මසූරිය රජු | ඉබන් බතූතා | චූල වංශය |

19. "මහනුවර පෙරහැරේ රූමත් තරුණියෝ ලස්සනට නටත්, ඔවුන්ගේ උඩුකය නග්න වූ අතර .... " යනුවෙන් සඳහන් යුගය සහ දේශ සංචාරකයා ඇතුළත් වරණය වනුයේ,
I 4 පේළියේ A තීරුව හා 4 පේළියේ C තීරුව
II 4 පේළියේ A තීරුව හා 1 පේළියේ D තීරුව
III 3 පේළියේ A තීරුව හා 4 පේළියේ C තීරුව
IV 3 පේළියේ A තීරුව හා 1 පේළියේ B තීරුව

20. නගර නිර්මාණයේ දී නාට්‍යශාලා පහක් ඉදි කරවන ලද රජු හා වංශ කතාව ඇතුළත් වරණය වනුයේ,
I 4 පේළියේ B තීරුව හා 4 පේළියේ D තීරුව
II 2 පේළියේ A තීරුව හා 4 පේළියේ D තීරුව
III 2 පේළියේ A තීරුව හා 3 පේළියේ B තීරුව
IV 1 පේළියේ A තීරුව හා 3 පේළියේ D තීරුව

21. හමුදා සෙබළුන්ගේ ආස්වාදය සඳහා පරාක්‍රමබාහු රජු විසින් ඉදිකළ ස්ථානය හා යුගය ඇතුළත් වරණය වනුයේ,
I 1 පේළියේ C තීරුව හා 2 පේළියේ C තීරුව
II 3 පේළියේ C තීරුව හා 2 පේළියේ D තීරුව
III 1 පේළියේ C තීරුව හා 2 පේළියේ D තීරුව
IV 2 පේළියේ B තීරුව හා 2 පේළියේ C තීරුව

22. කුඹි කතාව මුද්‍රා නාට්‍ය ප්‍රථම නිෂ්පාදනය සිදු වූ වර්ෂය වන්නේ,
I 1936 II 1961 III 2007 IV 2005

23. නල දමයන්ති මුද්‍රා නාට්‍යයේ හංස ධේනුවගේ චරිතයට නර්තනයෙන් දායක වූ ශිල්පිනියකි,
I වජිරා චිත්‍රසේන II අංජලිකා චිත්‍රසේන III මිරැන්ඩා හේමලතා IV ටානියා බැරකෝමා

24. මනෝහර බන්ධනම්, ෂද්දන්තදායම් යන කලා කෘති නිර්මාණය කරන ලද්දේ,
I ශේෂා පලිහක්කාර විසිනි. II ශාන්තිදේව් ඝෝෂ් විසිනි. III රවීන්ද්‍රනාත් තාගෝර් විසිනි. IV සීබට් ඩයස් විසිනි.

25. ජීවිතයත් මුහුද වගේ ඉමක් නැතේ කොනක් නැතේ .... යන ගීත ඛණ්ඩය ඇතුලත් මුද්‍රා නාට්‍ය වන්නේ,
I නල දමයන්ති II දියවන්නාව III මහවැලි IV කරදිය

26. රැවුළ, කොණ්ඩා සැරසීම ආදිය උපයෝගී කර ගන්නා අංග රචනය වනුයේ,
I සරල අංගරචනය II ශෛලිගත අංග රචනය III ස්වභාවික අංගරචනය IV විකාරරූපී අංග රචනය

27. හනික වරෙව් කොල්ලනේ .. ගීතය ගායනා කරන ලද්දේ,
I ජැක්සන් ඇන්තනී ඇතුළු පිරිස ය.
II රොබට් ජුලින්හි ඇතුළු පිරිස ය.
III ඩබ්.ඩී. අමරදේව ඇතුළු පිරිස ය.
IV බන්දුල ජයවර්ධන ඇතුළු පිරිස ය.

28. සොකරි නාටකයේ එන චරිත අතරින් දරුවකුගේ ස්වභාවය නිරූපිත කොළපත් වෙස් මුහුණක් පැළඳි චරිතයකි.


I පරයා II වෙදරාළ III ගුරුහාමි IV සොත්තානා

29. "තුන් මස් තුන් පෝයක් ගත වන්නේ .... " මෙම කවිය අයත් ගැමි නාටකය වන්නේ,

I රූකඩ II කෝලම් III නාඩගම් IV සොකරි

• ප්‍රශ්න අංක 30 සිට 34 දක්වා ප්‍රශ්න වලට පහත රූප සටහන් ඇසුරින් පිළිතුරු සපයන්න.


A




B



C



D



30. B රූපයේ දැක්වෙන වාද්‍ය භාණ්ඩයට අයත් නර්තන සම්ප්‍රදාය ආරම්භයට පාදක වූ ගැමි නාටක දෙක වන්නේ,

I තෝඩායම් හා පුරප්පාට් II රාමාට්ටම් හා ක්‍රිෂ්ණාට්ටම්

III රාමාට්ටම් හා පුරප්පාට් IV තෝඩායම් හා ක්‍රිෂ්ණාට්ටම්

31. C රූපයේ දැක්වෙන වාද්‍ය භාණ්ඩයට අයත් නර්තන සම්ප්‍රදායේ නර්තන අංග කිහිපයකි.

I අලාරිප්පු, පදම් II ආමද්, ශබ්දම් III තෝඩායම්, අලාරිප්පු IV ආමද්, සලාම්

32. A රූපයේ දැක්වෙන ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය යොදා ගන්නා නර්තන සම්ප්‍රදාය වනුයේ,

I භරත II කතකලි III කථක් IV මණිපුරි

33. D රූපයේ දැක්වෙන වාද්‍ය භාණ්ඩයට අයත් නර්තන සම්ප්‍රදාය උගන්වන ආයතනය වන්නේ,

I කේරළ කලා මණ්ඩලම් II අඩියාර්හි කලා ක්ෂේත්‍රම්

III විශ්ව භාරතී විශ්ව විද්‍යාලය IV ශාන්ති නිකේතනය

34. ඉහත රූප අතුරින් භරත නාට්‍යම් සම්ප්‍රදායට අයත් වාද්‍ය භාණ්ඩ දෙක ඇතුළත් වරණය වන්නේ,

I A සහ D II A සහ C III B සහ D IV C සහ D

35. උඩරට වෙස් ඇඳුම් කට්ටලයේ සිබාබන්ධනය, කෛමෙත්ත, සිලම්බු යන මේවා පළඳින ස්ථාන පිළිවෙලින්

I ඉනට, හිසට, අතට II හිසට, අතට, පයට

III හිසට, අතට, බෙල්ලට IV කරට, අතට, පයට

36. ශාන්තිකර්ම සැරසිලි අතරින් අයිලය සහ යක්ගෙය අයත් වනුයේ,

I කඩවර කංකාරියේ දීය. III කොහොඹා කංකාරි ශාන්තිකර්මයේ දීය.

II දෙවොල් මඩු ශාන්ති කර්මයේ දීය. IV පහන් මඩු ශාන්තිකර්මයේ දීය.

37. වංගෙඩිය හා නවකොළ අත්ත රංග භාණ්ඩ ලෙස භාවිත කරන යක්කම වන්නේ,

I වතේ යක්කම II ඌරා යක්කම III වැදි යක්කම IV අසුර යක්කම

38. උඩරට, පහතරට, සබරගමු යන නර්තන සම්ප්‍රදායන්හි ප්‍රවර්ධනයට දායක වූ නර්තන ශිල්පීන් පිළිවෙලින්,

I නිත්තවෙල ගුණයා, රද්දැල්ලේ පොඩි මහත්තයා, කේ.එස්. ප්‍රනාන්දු

II අර්නොලිස් ඉඹුල්ගොඩ, කේ.එස්. ප්‍රනාන්දු, සිරිබෝහාමි

III සිරිබෝහාමි, අර්නොලිස් ඉඹුල්ගොඩ, හීන්තිලමේ මහතා

IV කේ.එස්.ප්‍රනාන්දු, සිරිබෝහාමි, අර්නෝලිස් ඉඹුල්ගොඩ

39. නර්තන ක්‍රියාකාරකම් මගින් පුද්ගලයෙකු තුළ ඇති වන කායික කුසලතා දෙකකි.

I චලන හැකියාව හා සහානුකම්පනය III නම්‍යතාව හා රසාස්වාදය

II ඉවසීම හා සහානුකම්පනය IV චලන හැකියාව හා මාංශපේශි ශක්තිමත් බව

40. පන්තිකාමරය තුළ කණ්ඩායම් නර්තනාංගයක් නිර්මාණය කිරීමෙන් ඇති වන කුසලතාවක් නොවන්නේ,

I අන්මත ගරු නොකිරීම II සාමූහිකව කටයුතු කිරීම

III නිර්මාණශීලීව සිතීම IV නායකත්වයට ගරු කිරීම



(4) WWW.PastPapers.WiKi (3)
Download Term Test Papers, Short Notes From One Place!

## නර්තනය II පත්‍රය

• පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ. පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 04 ට පිළිතුරු සපයන්න.

1. I පා සරඹයක් නටා අවසන් කරනුයේ ............................................ පදයෙනි.
   II ප්‍රථම රාජ්‍ය මුද්‍රා නාට්‍ය උළෙල ....................................වර්ෂයේදී පවත්වන ලදී.
   III දොං පිංත ගත දොංත වට්ටම මාත්‍රා ................................ තාල රූපයට අයත් වේ.
   IV කථකලි නර්තන සම්ප්‍රදායේ මූලික අංග රචනය ................................... නම් වේ.
   V දෙවොල් මඩු ශාන්තිකර්මයේ එන .................................... පත්තිනි දේවියගේ උපත පිලිබඳ කියැවෙන නාට්‍යමය පෙළපාලියකි.
   VI කොහොඹා කංකාරියේ කුඩා ගුරු, මහා ගුරු යන චරිත ......................... නාට්‍යමය පෙළපාලියේ ඇතුළත් වේ.
   VII හේව්සි වාදනයට යොදා ගනු ලබන ................................. සුසිර වාද්‍ය භාණ්ඩයකි.
   VIII උස පුවක් කණුවක ගොක්කොළ දම්වැල්වලින් සරසන ලද .......................... ගස පහතරට දෙවොල්මඩු ශාන්තිකර්මයේ සැරසිලි අංගයකි.
   IX සබරගමු සම්ප්‍රදායේ කලාසම යන්නට සමාන පහතරට සහ උඩරට නර්තන කොටස වන්නේ,
   (අ) පහතරට ............................................... (ආ) උඩරට ............................................
   X ආහාර්ය අභිනයේ ප්‍රධාන කොටස් දෙකකි.
   (අ) ......................................................... (ආ) .........................................................

(ල: 1X12 = 12)

2. I සැවුලා වන්නමට අයත් බෙර පදය ප්‍රස්තාර කරන්න. (ල. 4)
   II මහ තනි තිතට අයත් රබන් කවියක මුල් කවි පද දෙක ප්‍රස්තාර කරන්න. (ල.4)
   III දොං පිංත ගත දොංත වට්ටමේ අඩව්වක් ප්‍රස්තාර කරන්න. (ල.4)

3. පහත සඳහන් මාතෘකා අතරින් තුනක් පිලිබඳව විස්තර කරන්න.
   I තුන්තිතේ ප්‍රභේද
   II මිරැන්ඩා හේමලතා
   II රබන් පද
   IV සාත්ත්වික අභිනය
   V සොකරි රඟමඩල

(ල.4X3 = 12)

4. "ශාන්තිකර්ම වනාහි දේශීය නර්තන සම්ප්‍රදායන්හි කෝෂ්ඨාගාරය ලෙස හැඳින්විය හැක"
   I ශාන්තිකර්ම තුනටම පොදු ගායන හතරක්නම් කරන්න. (ල. 4)
   II කොහොඹා කංකාරි ශාන්තිකර්මයේ නාට්‍යමය පෙළපාලි දෙකක් දක්වා එකක් විස්තර කරන්න. (ල.4)
   III දේශීය ශාන්තිකර්ම අභාවයට යාම වැළැක්වීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ විමසීමක් කරන්න. (ල.4)

5.



   I මෙම රූපයට අයත් නර්තන සම්ප්‍රදාය නම් කර ප්‍රචලිත ප්‍රදේශ දෙකක් ලියා දක්වන්න. (ල.4)
   II එහි ප්‍රධාන වාද්‍ය භාණ්ඩය නම් කර කෙටියෙන් විස්තර කරන්න. (ල.4)
   III මෙම රූපයට අයත් නර්තන සම්ප්‍රදායේ වේෂ නිරූපණය පිළිබඳ විස්තර කරන්න. (ල.4)

6. "දේශීය නාට්‍ය කලාවන් අතර මුද්‍රා නාට්‍ය වූ කලී සුවිශේෂී කලා මාධ්‍යයකි"
   I මුද්‍රා නාට්‍ය යන්න කෙටියෙන් නිර්වචනය කරන්න. (ල.4)
   II දේශීය මුද්‍රා නාට්‍ය කලාවේ ආරම්භය හා විකාශය පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.(ල.4)
   III දේශීය මුද්‍රා නාට්‍ය කලාවේ ප්‍රවර්ධනයට දායක වූ ශිල්පියෙකුගේ හෝ ශිල්පිනියගේ සේවය ඇගයීමක් කරන්න. (ල.4)

7. "දේශීය නර්තන සම්ප්‍රදායන් ත්‍රිත්වයෙහිම විචිත්‍ර වූ රංග වස්ත්‍රාභරණ දක්නට ඇත."
   I උඩරට හා සබරගමු සම්ප්‍රදායට අයත් ප්‍රධාන ඇඳුම් කට්ටල දෙක නම් කරන්න. (ල.4)
   II උඩරට සම්ප්‍රදායික ඇඳුම් කට්ටලටයේ ඉන හැඩයක ආකෘතියක් නිර්මාණය සඳහා යොදා ගත හැකි අමුද්‍රව්‍ය 04 ක් ලියා දක්වන්න. (ල.4)
   III ඔබ නිර්මාණය කරන ලද රංගාභරණයක් චිත්‍රණය කර සකස් කරගත් ආකාරය පියවර වශයෙන් දක්වන්න. (ල.4)

PAST PAPERS WIKI



Download Term Test Papers, Short Notes From One Place!

10 ශ්‍රේණිය

තෙවන වාර පරීක්ෂණය - 2023

# නර්තනය පිළිතුරු පත්‍රය

## I පත්‍රය

| | | | |
|---|---|---|---|
| 1. - 3 | 11. - 2 | 21. - 3 | 31. - 4 |
| 2. - 2 | 12. - 2 | 22. - 3 | 32. - 1 |
| 3.- 1 | 13. - 2 | 23. - 1 | 33. - 2 |
| 4.- 4 | 14. - 3 | 24. - 2 | 34. - 1 |
| 5.- 4 | 15. - 1 | 25. - 4 | 35. - 2 |
| 6.- 1 | 16. - 4 | 26. - 2 | 36. - 3 |
| 7.- 3 | 17. - 2 | 27. - 1 | 37. - 1 |
| 8.- 1 | 18. - 1 | 28. - 4 | 38. - 2 |
| 9.- 2 | 19. - 4 | 29. - 4 | 39. - 4 |
| 10.- 3 | 20. - 2 | 30. - 2 | 40. - 1 |

## II පත්‍රය

1. I හමාර
   II 1961
   III 2+ 3 (සුළු මැදුම්)
   IV ඩෙප්පු
   V අඹ විදමන
   VI ගුරුගේ මාලාව
   VII හොරණෑව
   VIII කාල පන්දම් ගස
   IX අ - ඉරට්ටිය
   ආ- කස්තිරම
   X අ - අංග රචනය
   ආ - වෙස් මෝස්තර රචනය
   (ල.1X12 + 12)

2. I

^ / ^ /

| 1 | 2 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| දොං | - | දොං | - | ජිං | - | ජිං | - | ග | ජි | ග | ත |

විභාග කර දැක්වීම හා තාල සංඥා - ල.2
නිවැරදිව ප්‍රස්තාර කිරීම - ල.2

II / / /

| 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| + | ත්‍රිවි | ධ | ඥා | - | න | - | විදූ | රූ | - | - | පධි | අ | පෙ | ම | හ |
| + | ගෞ | ත | ම | නම් | - | මු | නි | ඳු | - | - | එ | බු | දු | වූ | - |
| + | ගෞ | ත | ම | නම් | - | මු | නි | ඳු | - | - | - | - | - | - | - |

මහ තනි තිතට අදාළ විෂය නිර්දේශයේ ඇති වෙනත් කවියක් ප්‍රස්තාර කර ඇත්නම් ලකුණු ලබාදෙන්න.

විභාග කර දැක්වීම හා තාල සංඥා - ල.2
නිවැරදිව ප්‍රස්තාර කිරීම - ල.2

III

^ / ^ /

| 1 | 2 | 1 | 2 | 3 | 1 | 2 | 1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|
| තක් | - | ත | ක | ට | ත | ක | රොං | - | - |
| තක් | කඩ | තක් | කඩ | කුඳ | ත | ක | රොං | - | - |
| ත | ක | රොං | - | ග | ජිං | - | ජි | කු | ද |
| කි | ට | ත | ක | ට | කුං | - | දත් | - | - |
| ජි | ක | රොං | | | | | | | |

විභාග කර දැක්වීම හා තාල සංඥා - ල.2
නිවැරදිව ප්‍රස්තාර කිරීම - ල.2

★ (දොං ජිංත ගත දොංත වට්ටමේ 02 වන අඩව්ව වන "තාම් ජිං තත් තත් ..... අඩව්ව නිවැරදිව ප්‍රස්තාර කොට ඇත්නම් ලකුණු ලබා දෙන්න.)

3. I තුන් තිතේ ප්‍රභේද :- තනි තිතේ තාල රූප තුනක් එක් වීමෙන් තුන් තිත් තාල සෑදෙන බව
   උදා :- දෙසුළු මැදුම් තුන්තිත (2+2+ 3)
   දෙසුළු මහ තුන් තිත (2+2+4)
   තුන් තිතට අයත් බෙර පදයක් හෝ කවි පදයක් ප්‍රස්තාර කොට ඇත්නම්

II රබන් කවි:-

✓ දේශීය අවනද්ධ භාණ්ඩ අතර විශේෂ භාණ්ඩයක් බව
✓ ආතත ඝනයට අයත් වන බව
✓ එකැස් බෙරය ලෙස හඳුන්වන බව
✓ රබන් වර්ග සඳහා යොදා ගෙන ඇති ගායනා විවිධත්වයෙන් යුක්ත වන බව
✓ විවිධ නාදමාලා හා තාලරූප භාවිත කරන බව
✓ බෝධිසත්ව චරිතය, කාන්තා ලාලිත්‍ය, ස්වභාව සෞන්දර්ය පිළිබඳ වර්ණනා කෙරෙන බව
✓ රබන් කවියක් උදාහරණ ලෙස දක්වා තිබීම

III මිරැන්ඩා හේමලතා :-

✓ 1938 .11.15 දින උපත ලබා ඇති බව
✓ ඉන්දියාවට ගොස් භරත නැටුම් හදාරා ඇති බව
✓ අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රම නර්තන අධ්‍යක්ෂිකා ධූරය දරා ඇති බව
✓ ගුරු මාර්ගෝපදේශ, ගුරු අත්පොත්, විෂය මාලා සැකසීම, ගුරු පුහුණු පැවැත්වීම ආදිය
✓ ඇයගේ නර්තන ප්‍රසංග හා මුද්‍රා නාට්‍ය නම්කර ඇත්නම් .....


IV සාත්ත්වික අභිනය :-

✓ සතර අභිනයෙහි එක් අභිනයක් බව
✓ හාස්‍ය, ප්‍රහර්ෂ, දුක්ඛ, ලජ්ජා, භය ආදී මිනිස් ස්වභාව නිරූපණය කෙරෙන බව
✓ මුහුණෙන් පෙන්වන හැඟීම් පමණක් නොවන බව...

V සොකරි රඟමඩල :-

✓ සොකරි රඟ මඩල කමත ලෙස හඳුන්වන බව
✓ එය වටකුරු රඟමඩලක් බව
✓ රඟ මඩල මැද වංගෙඩියක් මුනින් අතට හරවා ඒ මත ලන්තෑරුමක් තැබීම මෙහි සම්ප්‍රදාය බව
✓ එක් පසෙකින් මල් පහන් පැලක් තනා ඇති බව
✓ ආලෝකය ලබා ගැනීමේදී පන්දම් භාවිත කරන බව
✓ බෙර වාදකයා හා අත්වැල් ගායකයන් එක් පසෙක සිටින බව .....

සොකරි රඟමඩල




(ල. 4X3 =12)

4. I සිරස පාද, කඩතුරා, ශ්ලෝක, අෂ්ටක ... ආදී වශයෙන් දක්වා ඇත්නම් (ල.4)

II ගුරුගේ මාලාව
යක්කම්
ගබඩා කොල්ලය

ගුරුගේ මාලාව :-

★ කුඩා ගුරු හා මහා ගුරු යන චරිත දෙකක් හමුවන බව
★ මෙහි එන සංවාද මගින් ඔවුන්ගේ උපත් කතා, ආගමනය, පිළිබඳ තොරතුරු ඉදිරිපත් වන බව
★ ගුරුගේ මාලාව යනු බත් මාලාවක් බව
★ මෙහිදී යක්දෙස්සා හා බෙරකරුවා අතර සංවාදයේ යෙදෙන බව
★ හාස්‍ය රසය මතු කරන දෙබස් ඇතුළත් වන බව ......

යක්කම් :-

★ යක්කම් ගණනින් 05 ක් බව
★ එනම්, ඌරා යක්කම, වැදි යක්කම, නයා යක්කම, සීතා යක්කම, දර්ශන යක්කම, බොරු යක්කම ලෙස නම් කිරීම.
★ මෙම යක්කම් වලට අයත් කථා රඟ දක්වන බව .......

ගබඩා කොල්ලය :- ★ ශාන්ති කර්මය අවසානයේ ශාන්තිකර්මය සඳහා ගෙනා භාණ්ඩ ගබඩා කර තැබූ මඩුව සංක්‍රාන්තමකව ගිනි තබන බව
★ දෙබස් හා නාට්‍යමය ලක්ෂණ මේ තුළින් දක්නට ලැබෙන බව
(නාට්‍යමය පෙළපාලි අංග දෙකක් නම් කිරීමට - ල. 2
එකක් විස්තර කිරීමට - ල. 2)

III ★ පාරම්පරික ශිල්පීන් අගය කිරීම හා ආරක්ෂා කිරීම.
★ ජනමාධ්‍ය හරහා විකාශනය කිරීම.
★ ශාන්තිකර්ම රඟ දක්වන අවස්ථා රූගත කර ශ්‍රව්‍ය දෘශ්‍ය පට සම්පාදනය කිරීම ....... ආදී කරුණු දක්වා ඇත්නම් (ල.4)

5. I කථකලි නර්තන සම්ප්‍රදාය (ල. 2)

ප්‍රචලිත ප්‍රදේශ - චෙරුතුරුති, කේරළ ප්‍රාන්තය, ගුරුවායුර්, කොචින්, ත්‍රිවැන්ද්‍රම් (ල.2)

II චෙන්ඩාව (ල.1)

★ දවුලේ හැඩයට සමානය.
★ මුහුණත උඩ පැත්තට සිටින සේ තබා කෝටු දෙකකින් වාදනය කරන බව
★ ඒ අතකින් හා කෝටුවකින් වාදනය කරන අවස්ථා ද ඇති බව
★ ආදී වශයෙන් කරුණුලියා රූපයක් ඇඳ අතිනම් (ල. 3)

III ✓ කථකලි වේෂ නිරූපණ ශිල්පියා පත්තුකාරන් ලෙස හඳුන්වන බව
✓ මෙහිදී චරිත වර්ග 6 ට වෙන් කෙරෙන අතර භාවිත වේෂ නිරූපණ ක්‍රම 6 දක්වා කෙටියෙන් විස්තර තිබීම.

- මිනික්කු - ඔප දමන ලද අරුත දෙයි. සාමාන්‍ය වේෂ නිරූපණ ක්‍රමයයි.
- පච්චා - කොළ පැහැය වැඩියෙන් භාවිතා කරයි.
- කත්ති - පිහිය යන අරුත දෙයි. නාසයේ උඩ කෙළවරේ සිට නළල දෙසට තියුණු වක ගැසුණු පිහියක ස්වරූපයක් ගනී.
- තාඩි - රැවුල යන අරුත දෙයි. සුදු, කළු, රතු රැවුල භාවිත කරයි.
- කාරි - හාස්‍යෝත්පාදක ගණයට අයත් චරිත සඳහා මෙම ක්‍රමය යොදා ගනී.
- ඩෙප්පු - නර්තන ශිල්පියා විසින් කරනු ලබන මූලික අංග රචනයයි. (ල.4)


Download Term Test Papers, Short Notes From One Place!

6. I ★ චලන'මාධ්‍ය තොට ගන්නා බව ★ භාවමය සංගීතයක් ප්‍රබලව යොදා ගන්නා බව

★ රංග වස්ත්‍රාභරණ, වේෂ නිරූපණ, විදුලි ආලෝකය, වේදිකා සැරසිලි ආදියේ සහය ඇතිව යම් සිද්ධියක් හෝ කතා ප්‍රවෘත්තියක් ඉදිරිපත් කර බව .... ආදී කරුණු ඇතුළත් කොට ලියා ඇතිනම් (ල.4)

II ★ 1934 දී රවීන්ද්‍රනාත් තාගෝර් තුමාගේ පැමිණීම සිදු වූ බව.

★ "ශාප් මෝචන්" නෘත්‍ය නාටකය ප්‍රදර්ශනය කළ බව

★ ශාන්ති දේව් ඝෝෂ් විසින් නිර්මාණය කළ නිර්මාණ පිළිබඳව දක්වා තිබීම (සීතාහරණ, මනෝහර බන්ධනම්..)

★ මෙරට ශිල්පීන් භාරතයට ගොස් ඉන්දිය නර්තන කලාවන් හා සංගීතය ඉගෙන ගෙන මෙරටට පැමිණ නව නිර්මාණ බිහිකළ බව.

★ දේශීය මුද්‍රා නාට්‍ය ශිල්පීන් දක්වා ඔවුන් පිලිබඳ විස්තර කර තිබීම. (ල.4)

III වජිරා චිත්‍රසේන, මිරන්ඩා හේමලතා, චිත්‍රසේන .... ආදී වශයෙන් එක් ශිල්පියෙකු හෝ ශිල්පිනියකගේ සේවය ඇගයීමට ලක් කොට ඇත්නම් (ල.4

7. I උඩරට - වෙස් ඇඳුම් කට්ටලය සබරගමු - පබළු ඇඳුම් කට්ටලය (ල.4

II රබර් ෆෝම් ෂීට් ,කෝඩ් නූල් ,කෙමිකික්ස්,ගම් ටේප් ,සිමෙන්ති කවර ,කාඩ්බෝඩ් ,ගල් වර්ග, රෙදි වර්ග ... ආදී වශයෙන් ලියා ඇත්නම්(ල.4)

III සුදුසු රංගාභරණයක් ඇඳ එය විස්තර කොට ඇත්නම්

(ල.4)

## නර්තනය - ප්‍රායෝගික පරීක්ෂණය - 2023

### 10 ශ්‍රේණිය - තුන්වන වාර පරීක්ෂණය

| ප්‍රශ්න අංකය | ක්‍රියාකාරකම | ලකුණු |
|---|---|---|
| 01 | **ගායනය හා වාදනය** | |
| I | කැමති ගායනය | 05 |
| II | රබන්/චාමර/ටීකා/ඔන්චිලි/නමස්කාර - ගුරු අභිමතය පරිදි එක් ගායනයක් | 05 |
| III | කැමති බෙර සරඹයක් වාදනය | 05 |
| IV | කැමති බෙර පදයක් වාදනය | 05 |
| | | 20 |
| 02 | **ගොඩ සරඹ නැටීම හා වට්ටම නැටීම.** | |
| I | 7 සිට 12 දක්වා නම් කරන ගොඩ සරඹයක් නැටීම. | 05 |
| II | කස්තිරම නර්තනය | 05 |
| III | දොං ජිංත ගත දොංත වට්ටම 01 හෝ 02 (ගුරු අභිමතය පරිදි) | 05 |
| IV | අදාළ අඩව්ව නර්තනය | 05 |
| | | 20 |
| 03 | **වන්නම් නැටීම.** | |
| I | සිංහරාජ වන්නම/සැවුලා වන්නම නර්තනය | 10 |
| II | කස්තිරම, සීරුමාරුව, අඩව්ව නර්තනය | 10 |
| | | 20 |
| 04 | **ගැමි නැටුම හා ජීවන වෘත්තීන්ට අනුව නර්තනය** | |
| I | චාමර නැටුම/ රබන් නැටුම | 10 |
| II | ධීවර/මැටි/පතල්/තේ/කොහු/කෘෂි | 10 |
| | | 20 |
| 05 | **නාට්‍ය ගීත අනුව නර්තනය හා නිර්මාණ කුසලතා** | |
| I | හනිකවරෙව් කොල්ලනේ ... /මෙම ගිම්හාන .... | 10 |
| II | වඳුරා/ධීවරයා/මොනරා/තේ දළු නෙලන්නිය (ගුරු අභිමතය පරිදි චරිත ලබා දී ඉහත චරිත වලට අදාළව සිද්ධියක් ගොඩනගා ගනිමින් චරිත නිරූපණය) | 10 |
| | | 20 |
| | | ලකුණු 100 න් |


(3) WWW.PastPapers.WiKi (3)

Download Term Test Papers, Short Notes From One Place!


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
T
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න